# ශ්‍රී ලංකාවේ බෞද්ධ සහ ඉස්ලාමීය සබඳතා පිළිබඳ සංක්ෂිප්ත කියවීමක්

## (1796-1915 බ්‍රිතාන්‍ය පාලන සමය)

වටරක්ගොඩ සුමන හිමි

දහනව වන සියවස වන විටත් ඉස්ලාම්වරුන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ වාණිජ අරමුණු ප්‍රමුඛ කොටගත් වෙළෙන්දන් වශයෙනි. මෙම වෙළඳ සබඳතා පදනම් කරගනිමින් භික්ෂූන් වහන්සේලා සහ ඔවුන් අතර යම් ආකාරයක සබඳතාවක් ගොඩනැගී තිබුණි. අමරපුරනිකායේ දඬලු පාර්ශ්වය ආරම්භ කළ කපුගම ධම්මක්ඛන්ධ හිමියන් උපසම්පදාව ලබා ගැනීමට 1807 අමරපුර දේශයට යන අතරතුර නාගපට්ටනයට පැමිණ එහි සිට සින්නපට්ටනමට පැමිණියේ සලංගු නමැති යෝනක මිනිසෙකුගේ නැවක නැගීය.[1] උපසම්පදාව ලබා යළි ලංකාව බලා පැමිණෙන අතරතුර 1809 මාර්තු මාසයේ නාගුරුපට්ටනමේ අබ්දුර් කාදර් නම් ධනවතෙකුගේ බඩු ගබඩාවේ නැවතී සිට ඇත. එතැනින් නාගපට්ටනමට පැමිණ යළිත් යෝනක ධනවතෙකුගේ බඩු ගබඩාවක නැවතී සිටියේය.[2] 1807 දී බුරුමයට ගොස් උපසම්පදාව ලබාගෙන පැමිණි රාමඤ්ඤ කල්‍යාණවංශික නිකාය පිහිට වූ කතලුවේ ගුණරතනතිස්ස හිමියන් ද ඉන්දියාවේ සිට බුරුමයට යාත්‍රා කොට ඇත්තේ යෝනක වෙළඳුන්ගේ නැව් වලිනි.[3] මේ ආකාරයට ලංකාවේ භික්ෂූන්ට අග්නි දිග ආසියාතික බෞද්ධාගමික රටවල් සමග සබඳතා පැවැත්වීමේ දී උපකාරී වී ඇත්තතේ මුස්ලිම් වාණිජ ප්‍රජාවය. එහෙත් ලංකාව අභ්‍යන්තරයේ දී මුස්ලිම්වරුන් හා භික්ෂූන්වහන්සේලා අතර සහ සබඳතා පැවති බවට තොරතුරු හමු නොවන තරම්ය.

ශ්‍රී ලංකාව තුළ මුස්ලිම්වරුන්ගේ ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමේ දී පෙනීයන්නේ කාලීනව බලසම්පන්න පාලකයාට සහය දක්වමින් ස්වකීය වාණිජ කටයුතු සිදුකරගෙන යාමේ පිළිවෙතක් අනුගමනය කරන ලද බවයි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජ දවස මඩිගේ රාජකාරි කටයුතුවල නියැලෙමින් සිටි මුස්ලිම්වරු උඩරට බ්‍රිතාන්‍යයන් විසින් යටත්කර ගැනීමෙන් පසුව බ්‍රිතාන්‍ය සේනාංක සඳහා අවශ්‍ය



ද්‍රව්‍ය සැපයීමේ කටයුතු සිදු කරගෙන ගියහ. ඔවුන් 1815 දෙසැම්බර් මාසයේ මහනුවර නගරයේ ආගමික පෙරහැරක් පවත්වා තිබේ. පෙර රජ දවස මෙබන්දක් නොතිබූ අතර එහිදී බෞද්ධයන් සමග ඇති වූ ගැටුමක දී භික්ෂූන් වහන්සේ නමකට අඩත්තේට්ටම් කොට උන්වහන්සේගේ වටාපතද ඉරාදමා තිබේ.[4] බෞද්ධයන් සහ මුස්ලිමුන් අතර ආගමික වශයෙන් ඇති වූ පළමු ගැටුම ලෙස මෙය හඳුනාගත හැකිය.

1818 දී ඌව වෙල්ලස්ස ප්‍රදේශය පදනම් කරගනිමින් කන්ද උඩරට අරගලය ආරම්භ වීම සඳහා ආසන්න හේතුවක් වශයෙන් හජ්ජි මරික්කාර් නමැත්තෙකුට වෙල්ලස්සේ මඩිගේ දෙපාර්තමේන්තුවේ මුහන්දිරම් තනතුර ලබාදීමේ සිදුවීම හඳුනාගත හැකිය.[5] බහුතරයක් සිංහල ප්‍රජාව වාසය කරන ප්‍රදේශයක මේ ආකාරයට මුස්ලිම් පුද්ගලයෙකුට තනතුරු ලබා දීම තුළින් පෙන්නුම් කරන්නේ ප්‍රජාවක් වශයෙන් මුස්ලිමුන් පාලක පැලැන්තිය ඉතා විශ්වාසවන්ත පිරිසක් ලෙසත් තත්කාලීන වාණිජ ආධිපත්‍යය ලබාගත් ප්‍රබල පිරිසක් ලෙසත් වර්ධනයට ලක්ව සිටි බවත්ය. බ්‍රිතාන්‍ය රජයේ ඉහළම තනතුරක් ලද ප්‍රථම මුස්ලිම් ජාතිකයා වූ මරික්කාර් සිංහලයන් විසින් ඝාතනය කිරීමෙන් පෙන්නුම් කරනු ලැබුවේ මුස්ලිම් වරප්‍රසාදයන්ට එරෙහිව තමන් තුළ ගොඩනැගී තිබූ විරෝධතාවයි.

දහනව වන සියවසේ මැද වන විට මුස්ලිම් ජාතිකයන් කොළඹ, නුවර සහ ගාල්ල යන ප්‍රදේශයන්හි විශාල වාණිජ ආධිපත්‍යයක් සනිටුහන් කිරීමට සමත්ව තිබුණි. එම්. එල්. එම්. සුලෙයිමාන් ලෙබ්බෙ 1856 පිටකොටුවේ කෙලින් වීදියේ රෙදිපිළි සහ ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පටන්ගත්තේය.[6] ඔහුගේ පුතා එස්. එල්. නයිනා මරික්කාර් එම ව්‍යපාර දැවැන්ත ව්‍යාපාර බවට පත් කොට 1927 පමණ වන විට ඉඩම් අක්කර 863 ක හිමිකරුවෙක් වී සිටියේය.[7] ගාල්ලේ ඔත්මාන් ලෙබ්බේ මාකන් මාකර් රත්නපුරේ සුළු මැණික් ව්‍යාපාරිකයෙකු ලෙස ව්‍යාපාර අරඹා 1860 ගාල්ලේ ඔරියන්ටල් හෝටලයේ ස්වර්ණාභාරණ සාප්පුවක් විවෘත කළේය.[8] කෝපි එකතු කිරීම හා අපනයනය කිරීමේ ව්‍යාපාරයක් කළ මීයාපුල්ලේ මරික්කාර් 1875 වන විට දුම්රබර කෝපි ඉඩම් අක්කර 263ක වතු හිමියෙක් බවට පත්ව සිටියේය.[9] කෝපි වෙළදාමේ නිරත වෙමින් වතු හිමියන්

වූ සින්නලෙබ්බේ සොහොයුරෝ 1865 වන විට අක්කර 6500ක කෝපි වතු 15ක් අයිතිකරගෙන සිටියහ.[10] උක්ත මාකන් මාකර්ගේ පුතාවූ ඕ. එල්. මොහොමඩ් මාකන් මාකර් ව්‍යාපාරික ප්‍රග්ධනය විවිධාංගීකරණයට ලක්කරමින් 1927 වන විට රබර් හා පොල්වතු අක්කර 731ක අයිතිය ලබගෙන තිබුණි.[11] මොහු කොළඹ ගාලුමුවදොර ලංකාවේ ප්‍රථම බහු මහල් ගොඩනැගිල්ල ඉදි කළේය.[12] මීට අමතරව එන්. ඩී. එච්. අබ්දුල් ගෆූර්, ඔහුගේ පුතුන් වන ස්මයිල්, සයිනුදීන්, ඒ. එම්. වප්චේ මරික්කාර්, අයි. එල්. එම් අබ්දුල් අසීස් යනාදීහු ද ධනවත් මුස්ලිම් ව්‍යාපාරිකයන් බවට පත්ව සිටියහ. මීට අමතරව ලංකාවේ ගම්මාන පුරා විසිරී යමින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ගැමියන් වෙත රැගෙන යන ප්‍රධාන වාණිජ ප්‍රජාව බවට ද සාමාන්‍ය මුස්ලිම් ජනයා පත්ව සිටියහ.

ඉතා සංක්ෂේපයෙන් දක්වන ලද මෙබඳු ආකාර වූ මුස්ලිම් ප්‍රජාවේ ආර්ථිකමය සංවර්ධනය දහනව වන සියවසේ අග භාගයේ සිට ආගමික අනන්‍යතාව පදනම් කරගත් වෙනම ප්‍රජාවක් ලෙස සංවර්ධනය වීමට අවශ්‍ය පසුබිම සකසන ලදී. බුද්ධාගම, ක්‍රිස්තියානි ආගම සහ හින්දු ආගම ස්වකීය අනන්‍යතාවන් සහිතව වර්ධනය වෙමින් පැවති මෙකී සමයේ මුස්ලිම් අනන්‍යතාවට ද විවිධ තර්ජන එල්ලවෙමින් පැවතුණි. එම තර්ජනවල පළමුවැන්න ලෙස කුමාරි ජයවර්ධන පෙන්වා දී ඇත්තේ 1888 දී ''යෝනකයන්ගේ ජනවර්ග විද්‍යාව'' යන මැයෙන් පී. රාමනාදන් මහතා විසින් පවත්වන ලද දේශනයයි.[13] මෙම දේශනයේ දී මුස්ලිම්වරුන්ගේ භාෂාව දෙමළ බැවින් ඔවුන් ද්‍රවිඩ මූලයක් සහිත ජනවර්ගයක් බවට රාමනාදන් විසින් කරන ලද ප්‍රකාශයට එරෙහිව විශාල පිබිදීමක් මුස්ලිම් සමාජය වෙතින් පැනනැංගේය. එම පිබිදීමට සිද්දි ලෙබ්බේ, එම්. සී. මොහොමඩ්, අයි. එල්. එම්. අසීස් යනාදීහු නායකත්වය ලබාදුන්හ. මේ අතරතුර ඉස්ලාම් ආගමික මත පදනම් කරගත් ස්වාධීන මුස්ලිම් ප්‍රජාවක් නිර්මාණය වීම සඳහා බලපෑ ප්‍රධාන සිදුවීමක් වූයේ 1882 ඊජිප්තුවෙන් පිටුවහල් කරනු ලැබූ ඔරාබි පාෂාගේ ලංකාගමනයයි. මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනික දියුණුවට මෙන්ම ආගමික මූලධර්මයන්ට අනුව අනුගත කරවීමේ කාර්යයේ දී ඔරාබි පාෂා විශාල බලපෑමක් සිදුකොට තිබේ.[14]

මේ ආකාරයට පෙළගැසෙන සිදුවීම් මාලාව විසින් ඉස්ලාම් ආගම පදනම් කරගත් මුස්ලිම් ජනවර්ගයට වෙනතම අනන්‍යතාවක්



සහිත ස්වාධීනතාවක් නිර්මාණය කොට දී තිබුණි. එම ස්වාධීනතාව ප්‍රකාශයට පත් කළ අවස්ථාවක් වශයෙන් 1890 ගාල්ලේදී බෞද්ධ පෙරහරක් සම්බන්ධව බෞද්ධයින් හා මුස්ලිම්වරු අතර ගැටුමක් ඇති වීම පෙන්වා දිය හැකිය.[15] මෙබඳු හේතු පදනම් කරගනිමින් ක්‍රිස්තියානීන්ට එරෙහිව ගොඩනැඟී තිබූ බෞද්ධ විරෝධය විසිවන සියවස වන විට මුස්ලිම්වරුන් වෙත එල්ලවීමේ ප්‍රවණතාවක් වර්ධනය වන ආකාරය හඳුනාගත හැකිය. එහි උච්චතම අවස්ථාව 1915 දී සනිටුහන් වේ.

මෙම අර්බුදය ඉස්මතු වන්නේ බෞද්ධ පෙරහැරවල් පැවැත්වීම සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් පවනවන ලද නියෝගයක් පදනම් කරගෙනය. මුස්ලිම්වරුන්ගේ ඉල්ලීම පරිදි බෞද්ධ පෙරහැර පැවැත්වන විට මුස්ලිම් දේවස්ථාන අසළ දී බෙරගැසීම් ආදී ශබ්ද කිරීම් නැවැත්විය යුතු යැයි නියෝගයක් පණවා තිබුණි.[16] එහෙත් මෙම නියෝගය නිශ්චිත වශයෙන් කවර දිනක පනවන ලද්දක්දැයි යන්න පිළිබඳ සටහනක් සොයාගැනීමට අපහසුය. එහෙත් සරසවි සඳරැස පත්‍රයේ එන සටහනකට අනුව පෙනෙන්නේ 1904 කාලසීමාව වන විටත් මෙම නියෝගය පනවා තිබූ බවයි.[17] එහෙත් මෙම නියෝගය රට කලඹන තීරණයක් බවට පත්වන්නේ ගම්පොළ වලහගොඩ දේවාලයේ වාර්ෂිකව සිදුකෙරෙන පෙරහැර සම්බන්ධයෙන් 1912 දී මහනුවර ආණ්ඩුවේ ඒජන්තවරයා වූ ජී. එස්. සැක්ස්ටන් විසින් උක්ත නියෝගය ප්‍රකාරව කොන්දේසි පැනවීමත් සමග ය. මෙම කොන්දේසි පැනවීමට එරෙහිව දේවාලයේ බස්නායක නිලමේ විසින් දිස්ත්‍රික් උසාවියේ නඩු පවරන ලද අතර නඩු විභාගයේ දී කිසිදු බාධාවකින් තොරව බෞද්ධයන්ට පෙරහැර පැවැත්විය හැකි බවට තීන්දුවක් 1914 ජුනි මාසයේ දී ලබා දුණි.[18] මෙම තීන්දුවට එරෙහිව නීතිපති විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණය, දිස්ත්‍රික් උසාවිය විසින් ලබා දුන් තීරණය අවලංගු කොට මහනුවර දිසාපතිවරයා පැන වූ කොන්දේසි නීත්‍යනුකූල බව 1915 පෙබරවාරි 15 දින ප්‍රකාශ කළේය.[19] මෙම තීන්දු ප්‍රකාශනය බෞද්ධයන් අතර යම් ආකාරයක නොසන්සුන්තාවක් වර්ධනය කිරීමට හේතු විය. මෙම නොසන්සුන්තාව වර්ධනය වී පැතිර ගිය ආකාරය පිළිබඳව නිරීක්ෂණය කරන මහාචාර්ය නවරත්න බණ්ඩාර බෞද්ධ

25 MAY 2022

පුවත්පත් වූ සිංහල ජාතිය, දිනමිණ, සිංහල බෞද්ධයා, සරසවි සඳරැස යනාදී පුවත්පත් මගින් උක්ත නඩු තීන්දුවට විශාල ප්‍රසිද්ධියක් ලබා දීම, පරම විඥානාර්ථ සමාගමේ සහ අමද්‍යප ව්‍යාපාරයේ සක්‍රීයව කටයුතු කළ සී. ඒ. හේවාවිතාරණ, සී. බටුවන්තුඩාව, ඇඩ්මන්ඩ් හේවාවිතාරණ, ඒ. මැන්දිස්, මාර්ටිනස් සී. පෙරේරා, ආතර් වී. දියෙස්, ඩබ්. ඒ. ද සිල්වා, ඩී. බී. ජයතිලක, ඩී. ආර්. විජේවර්ධන ආදීන්ගේ මැදිහත් වීම, මුස්ලිම්වරුන්ගේ ආක්‍රමණශීලී හැසිරීම් යනාදිය ප්‍රධාන හේතූන් ලෙස හඳුනාගෙන තිබේ.[20]

මෙබඳු පසුබිමක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය වී ඇති අවස්ථාවේ 1915 මැයි 28 වන දින මහනුවර වාර්ෂික වෙසක් පෙරහැර පැවැත්වීමට කටයුතු යොදා තිබුණි. මෙම පෙරහැර පැවැත්වීමේ දී ද නගරයේ ඇති මුස්ලිම් දේවස්ථාන ඉදිරිපිටින් ගමන් කිරීමේ දී යාර සියයක දුර සිට තූර්ය වාදන ශබ්ද නතර කළ යුතුය යන කොන්දේසිය පනවා තිබුණි. මෙම කොන්දේසි පැනවීමේ දී එවකට පැවති පොලිසිය මුස්ලිම්වරුන්ට පක්ෂපාතී බව ඔප්පු කිරීම සඳහා ඩී. අප්පුහාමි නමැති අයෙකු විසින් මහනුවර පෙරහැර පැවැත්වීම සම්බන්ධයෙන් 1905, 1914 සහ 1915 යන වසරවල දී නිකුත් කරන ලද බලපත්‍ර තුනක් යටත් විජිත භාර ලේකම් බොනර් ලේ වෙත ඉදිරිපත්කොට තිබේ. එම ඉදිරිපත් කිරීම්වලින් 1905 බලපත්‍රයේ දක්වා ඇත්තේ වෙසක් බැති ගී පෙරහැර ගමන් කිරීමේ දී කිසියම් ආගමික ස්ථානයක ආගමික මෙහෙයක් සිදුවෙමින් පවතින්නේනම් එම ස්ථානයට දෙපස යාර සීයක දුර සිට තූර්ය වාදන නවත්වා නිහඬව ගමන් කළ යුතුය යනුවෙනි. මෙම නියමය 1915 බලපත්‍රයේ දැක්වෙන්නේ මුස්ලිම් පල්ලි අසල දී තූර්ය වාදන නවත්වා නිහඬව ගමන් කළ යුතුය යනුවෙනි.[21] ඉඩකඩ අතින් ඉතා විශාල නොවූ මහනුවර නගරයේ ක්‍රිස්තියානි පල්ලි, හින්දු කෝවිල් සඳහා නොපැනවෙන නීතියක් මුස්ලිම් පල්ලි සඳහා පනවා තිබීමෙන් පැහැදිලි වන්නේ ඒ වන විට මුස්ලිම්වරුන් විසින් තමන්ට පමණක් අනන්‍ය වූ තත්ත්වයක් කුමනාකාරයකින් හෝ ගොඩනගාගෙන සිටි බවය. මෙහි දී විශේෂ වශයෙන් සැලකිය යුත්තේ ක්‍රිස්තියානි ආණ්ඩුවක් පවතිද්දී එකී ආගමේ පල්ලිවලට හිමි නොවූ තත්ත්වයක් මුස්ලිම් පල්ලිවලට හිමි වීම පිළිබඳව ය. එසේම මේ සමගම බද්ධවන තවත් කාරණාවක් ලෙස පෙරහැර සමයේ



මහනුවර නගරයේ දන්සල් පැවැත්වීමට බලපත්‍ර නිකුත් නොකිරීම හඳුනාගත හැකිය. මහනුවර බෞද්ධ සංගමයක උපසභාපතිවරයෙකු වූ ඩබ්. පාවුලු ප්‍රනාන්දු වෙසක් දන්සල් සඳහා තාවකාලික මඩු ඉදිකිරීමට මහනුවර නගර සභාවේ ලේකම්ගෙන් බලපත්‍රයක් ඉල්ලූ විට එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ ලේකම්වරයා දන්වා ඇත්තේ හම්බ වෙළෙන්දන් බත් කඩ දමා ඇති බැවින් දන්සල් පැවැත්වීමට ඔවුන් විරුද්ධ බවයි.[22] මෙමගින් ද පෙනනුම් කරනු ලැබ ඇත්තේ 1915 වන විට මහනුවර මුස්ලිම්වරු කෙබඳු තත්ත්වයක් ගොඩනංවාගෙන සිටියේ ද යන වගයි.

කෙසේ නමුත් පනවන ලද විධානවලට අනුකූල වෙමින් බෞද්ධයන් විසින් මැයි 28 වන දින වෙසක් පෙරහැර පවත්වා තිබේ. පෙරහැර මුස්ලිම් දේවස්ථානය අසලින් ගමන් කිරීමේ දී එහි රැස්ව සිටි මුස්ලිම්වරුන් විසින් බෞද්ධයන්ගේ සාධු නාද සමච්චලයට ලක්කරමින් හූ කීම් සහ ගල් ගැසීම් ආදි කටයුතු කරමින් පෙරහැර කඩාකප්පල් කිරීමට කටයුතු කරන ලදී. මෙයින් කුපිත වූ බෞද්ධයෝ මුස්ලිම් පල්ලියටත් එහි රැස්ව උන් පිරිසටත් පහරදුන්හ. අසල පිහිටි මුස්ලිම් කඩවලට ද පහර දුන්හ.[23] පොලිස් පරීක්ෂක කුරේ මැදිහත්ව පොලිස් බල ඇණියක් රැගෙන විත් ගැටුම සංසිඳ වූ අතර පුද්ගලයන් 28 දෙනෙක් පමණ අත් අඩංගුවට ගැනුණි.[24] මෙම ගැටුමේ දී සිංහල හෝ මුස්ලිම් ජාතිකයන් කිසිවෙකුටත් බරපතල තුවාල සිදුනොවුණි. මෙම සිද්ධියට පසු දින විශාල වශයෙන් සිංහල පිරිස් මහනුවර නගරයට පැමිණෙමින් සිටියහ. මැයි 29 වන දින රාත්‍රියේ මෙසේ හැසිරෙමින් සිටි සිංහල තරුණයෙකුට මුස්ලිම් වෙළෙන්දෙකු විසින් වෙඩි තබා තිබූ අතර එම තරුණයා රෝහලට රැගෙන යන අතරතුර මිය ගියේය.[25] මෙම සිදුවීමත් සමග කෝපයට පත් වූ සිංහල වැසියන් විසින් මැයි 30 වන දින රාත්‍රිය එළිවන තුරු මුස්ලිම් කඩවලට පහර දී විනාශ කරන ලදී. මෙම මුස්ලිම් විරෝධී තත්ත්වය රට පුරා පැතිර ගිය අතර මුස්ලිම්වරුන්ගේ දේපල මංකොල්ලකමින් විශාල ව්‍යසනයක් ඇතිකරවීමට සමත්ව තිබුණි. මැයි 31 වන දින කොළඹ නගරයේ දුම්රිය වැඩපොළේ කම්කරුවන් පිරිසක් සහ මුස්ලිම් තේ කඩ හිමියන් පිරිසක් අතර ඇති වූ වචන හුවමාරුවක් පදනම් කරගෙන ආරම්භ වූ කලකෝලාහල ජූනි 11 වන දින දක්වාම ක්‍රියාත්මක වී තිබේ,

ජුනි දෙවන දින වන විට ලංකාවේ මධ්‍යම, ඌව, වයඹ, සබරගමුව, බස්නාහිර යන පළාත් පහේම සිදුවීම් වාර්තා වී තිබුණු අතර ස්ථාන 116ක ගැටුම් ඇති වූ බව වාර්තා වී ඇත.[26]

උඩ රට ප්‍රදේශයේ පෙරහැර පැවැත්වීමක් සම්බන්ධ ගැටලුවක් මුල්කරගනිමින් ආරම්භ වූ මෙම ගැටුම ප්‍රධාන වශයෙන්ම මුස්ලිම්වරුන් පන්සල් වෙහෙර විහාර ආදී බෞද්ධ සිද්ධස්ථාන විනාශ කරන්නට පැමිණෙන්නේය යනාදී වූ විවිධ කටකතා හේතුවෙන් දීපව්‍යාප්ත ගැටලුවක් බවට පත් විය. මෙම ගැටුම් වැළැක්වීම සඳහා මුලින් පොලිසිය උදාසීනව කටයුතු කිරීම ගැටුම් වර්ධනය වීමට ප්‍රධාන හේතුවක් වූ අතර එසේ වී ඇත්තේ බ්‍රිතාන්‍ය ඒ වන විට තුර්කිය සමග යුද්ධයක පැටලී සිටි බැවින් මුස්ලිම්වරුන් ලංකාවෙන් පන්නා දැමීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුවට අවශ්‍ය බැවින් යැයි ද කටකතාවක් පැතිරී තිබුණි.[27] මේ අතරතුර මෙම අවස්ථාවෙන් මංකොල්ලකරුවන් බොහෝ වාසි ලබන ලද බව වාර්තා කොට ඇති සිදුවීම් විමර්ශනය කරන විට පැහැදිලි වේ. මංකොල්ලකරුවන් පිටුපස යමින් සාමාන්‍ය ගැහැණු මිනිස්සු සහ කොලු කුරුට්ටන් පවා බිඳ දමන ලද කඩ සාප්පුවලින් බඩු ඔසවාගෙන යනු බොහෝ දෙනෙකු දැක තිබේ.[28] කිසිදු පූර්ව සැලසුමකින් තොරව ඇති වූ මෙම අර්බුදය ඉතා ක්ෂණිකව රට පුරා පැතිර ගිය අතර කෝලාහල වැඩිපුර සිදු වූ බස්නාහිර පළාත පාලනය කිරීමට ආණ්ඩුකාරයා විසින් 1915 ජුනි 02වන දින යුධ නීතිය ප්‍රකාශයට පත් කරන ලදී.[29] ඊට පසු දින මධ්‍යම, දකුණ, වයඹ යන පළාත්වල ද යුධ නීතිය ක්‍රියාත්මක කරන ලදී. ජුනි 17 වන දින උතුරුමැද පළාතේ සහ ඌව පළාතේ ද යුධ නීතිය ක්‍රියාත්මක කරන ලදි. මෙම යුධ නීතිය දින සියයක් පුරා ක්‍රියාත්මක කොට තිබේ.

යුධ නීතිය යටතේ සිංහල බෞද්ධ ප්‍රබෝධය සඳහා කටයුතු කළ නායකයන් විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනුණි. එයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මුස්ලිම් ජාතිකයන්ට එරෙහිව සිංහලයන් විසින් මෙහෙයවන ලද ප්‍රචණ්ඩකාරීත්වය බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ක්‍රියාත්මක කරන ලද්දක් ලෙස පාලකයන් විසින් අර්ථ විවරණය කොටගෙන තිබීමය. සිංහල - මුස්ලිම් කෝලාහලය විමසීමේ දී පෙනීයන්නේ කිසිදු ලෙසකින් එහි දී බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව කටයුතු කොට නොමැති බවයි. කෝලාහලය සම්බන්ධයෙන්



පසුකාලීනව සිදු කෙරුණු විමර්ශනවල දී ද එය මැනවින් තහවුරු වන බව ආමන්ඩ් ද සූසා සහ නවරත්න බණ්ඩාර පෙන්වා දී තිබේ. එසේම මෙම යුධ නීතිය ක්‍රියාත්මක කිරීම මගින් සැක සහිත ඕනෑම පුද්ගලයෙකුට වෙඩි තැබීමට ආරක්ෂක අංශයට අවසර දී තිබූ අතර සාධාරණ පරීක්ෂණවලින් තොරව සිංහල මිනිසුන් මරා දැමීමත් අක්‍රමවත් අකාරයේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවන්ගෙන් සිංහල බෞද්ධයන් පීඩාවට පත්කිරීමත් සිදු කෙරුණි.

සිංහල - මුස්ලිම් කෝලාහලය යන්නෙන් විස්තර කෙරෙන ක්‍රියාවලිය තුළ මුස්ලිම් ජාතිකයන්ගෙන් සිංහල ජාතිකයන්ටත්, සිංහලයන්ගෙන් මුස්ලිම් ජාතිකයන්ටත්, ඊටත් වඩා රාජ්‍ය බලය සහිත බ්‍රිතාන්‍ය පාලනයෙන් සිංහල ජාතිකයන්ටත් විශාල වශයෙන් අගතීන් සිදුව තිබේ. එහි දී වඩා වැදගත් කාරණාව වන්නේ බෞද්ධ නායකයින් විශාල ප්‍රමාණයක් අත් අඩංගුවට ගැනීම හා ඔවුන්ට දඬුවම් නියම කිරීමයි. බෞද්ධ පුනර්ජීවන කටයුතු සඳහා සක්‍රීය දායකත්වය සැපයූ පානදුර ප්‍රදේශයේ ධනවතුන් වූ ඩයස් පවුලට සම්බන්ධ මෙරඤ්ඤගේ මතෙස් සල්ගාදුගේ පුතා වූ රිචඩ් සල්ගාදු සහ බෑනා වූ ආතර් ඩයස් බන්ධනාගාරගත කෙරුණි.[30] එන්. ඒ. ප්‍රනාන්දු විජේසේකර අත්අඩංගුවට ගෙන මරණ දඬුවම නියම කළේය. මරණ දඬුවම අත්හිට වූවත් යාපනය හිරගෙදර දී උණ සන්නිපාතයෙන් මිය ගියේය. ඔහුගේ මස්සිනා ඩී. ඊ. පේදිරිස් යුද්ධාධිකරණ නඩු විභාගයෙන් පසු වෙඩිතබා මරාදැමුණි. මොහුගේ පියා 1907 පරම විඥානාර්ථ සමාගමේ කාරකසභිකයෙකි.[31] 1891 සිට 1914 දක්වා බෞද්ධ පරම විඥානාර්ථ සමාගමේ සභාපති ආර්. ඒ. මිරැන්ඩෝ කෝලාහලයේ දී කැරලිකරුවන්ට තබන ලද වෙඩි පහරක් වැදී මිය ගියේය.[32] මීට අමතරව බෞද්ධ ජනනායකයින් ලෙස ප්‍රසිද්ධියක් ලබා සිටි එෆ්. ආර්.සේනානායක, ඩී. එස්. සේනානායක සහ ඩී. සී. සේනානයක යන සහෝදරවරුන් ද ඩී. බී. ජයතිලක, දොස්තර සී. ඒ. හේවාවිතාරණ, එඩ්මන් හේවාවිතාණ, එච්. අමරසූරිය, වෝල්ටර් ද සිල්වා, මාර්ටිනස් සී. පෙරේරා, එච්. එල්. සමරක්කොඩි, ඒ. එච්. ඊ. මොලමුරේ, ආතර් වී. දියෙස්, ඩබ්. ඒ. ද සිල්වා, හැරී ඩයස්, චාල්ස් ඩයස්, ජෝන් ද සිල්වා, ඩබ්. එච්. ඊ. පෙරේරා, ඩී. ජේ. ආර්. ගුණවර්ධන, ඒ. ඩබ්. පී. ජයතිලක යනාදීහු අත්අඩංගුවට ගන්නා ලදී.[33]

එපමණකින් නොනැවතුණු බ්‍රිතාන්‍ය ආණ්ඩුව ඒ වන විට ප්‍රකාශය කරමින් තිබූ සිංහල බෞද්ධ මතවාදය රැගත් පුවත්පත් වන සිංහල බෞද්ධයා, සිංහල ජාතිය, සරසවි සඳරැස, දිනමිණ, අනුරපුර පුවත, ශ්‍රී ලංකා සිරි යන සිංහල පුවත්පත් සම්පූර්ණයෙන් තහනම් කරන ලදී. එම පුවත්පත්වල කතෘවරුන්ට එරෙහිව නඩු පැවරීම ද සිදු කරන ලදී. පරම විඥානාර්ථ සමාගමේ කාර්යාලය පරීක්ෂා කොට එම සංගමය යටතේ පාලනය වූ පාසල්වලට රජය විසින් ලබාදුන් දීමනා නතර කෙරුණි.[34] මෙම ගැටුම් ඇතිවන සමයේ ඉන්දියාවට ගොස් සිටි අනගාරික ධර්මපාලතුමා ලංකාවට පැමිණීම වළක්වමින් ඔහු ඉන්දියාවේම රඳවා තැබීමට විධිවිධාන සකස් කරවීය.[35] මේ ආකාරයට ක්‍රියාත්මක වූ කෝලාහල මර්දන ක්‍රියාවලිය තුළ දී යුද්ධාධිකරණය විසින් 412 දෙනෙකු පරීක්ෂණවලට ලක්කොට ඉන් 34 දෙනෙකු මරා දමා 49 දෙනෙකුට මරණ දඬුවම නියම කෙරුණි. 25 දෙනෙකු බරපතල වැඩ සහිතව සිරගෙට නියම කරන ලද අතර නිදහස ලබා තිබුනේ 54 දෙනෙකු පමණි.[36]

මේ ආකාරයට කිසිදු විනිවිදභාවයකින් තොරව සිංහල බෞද්ධ නායකයන්ට එරෙහිව බ්‍රිතාන්‍ය ආණ්ඩුව ගෙන ගිය මර්දනකාරී පිළිවෙත බොහෝ උගත් ජනකණ්ඩාම් තුළ ආණ්ඩුව කෙරෙහි දැඩි අප්‍රසන්නභාවයක් ඇති කිරීමට හේතු විය. කිසිවෙකුටත් ආණ්ඩුවේ ක්‍රියාකලාපය ප්‍රශ්න කිරීමට ඉඩක් නොලැබුණු අතර ඒ සඳහා අවස්ථාව පැවති එකම ස්ථානය වූ ව්‍යවස්ථාදායක සභාව තුළ දී එම සභාව නියෝජනය කළ උගත් ලාංකික මන්ත්‍රීවරයා ලෙස නියෝජනය කළ පී රාමනාදන් සහ ද්‍රවිඩ මන්ත්‍රීවරයෙකු වූ කේ. බාලසිංහම් සිංහල බෞද්ධ නායකයන් වෙනුවෙන් පෙනී සිටියත් ඔවුන්ගේ මතවාද එකී සභාව තුළ දී පරාජයට පත් විය. 1915 සැප්තැම්බර් මාසය මුල දී යුධ නීතිය ඉවත් කළ පසු සිංහලයන්ට වූ අසාධාරණය වෙනුවෙන් ක්‍රමිකව අදහස් ඉදිරිපත් වීමට පටන් ගත්තේය. එම අදහස් දැක්වීම් ක්‍රමිකව වර්ධනය වී ශ්‍රී ලාංකීය ජාතික සංවිධාන බිහිවීම දක්වා ගමන් කිරීම සිදුවන ආකාරය ආසන්න අවුරුදු කිහිපය තුළ දී හඳුනාගත හැකිය.

අඩ සියවසක් තිස්සේ ක්‍රමිකව වර්ධනය වූ සිංහල බෞද්ධ ප්‍රජාවගේ බල වර්ධනය මර්දනය කිරීම සඳහා 1915 කෝලාහල අවස්ථාව බ්‍රිතාන්‍යයන්ට කදිම අවස්ථාවක් විය. ආගමික වේශයෙන්



වර්ධනය වූ මෙම බලය විසින් පළමුව ක්‍රිස්තියානි ආගම මතවාදීමය වශයෙන් පරාජය කිරීමට සමත්ව සිටි අතර ස්වාධීන ජාති මාමක අදහස්වලින් පෝෂණය වීම අරම්භ කොට තිබුණි. සිංහල බෞද්ධ ජනතාව ශ්‍රී ලංකාවේ තමන්ට එරෙහිව නැඟී සිටි සහ නැඟී සිටිය හැකි ජනවර්ගය බව මනාව හඳුනාගෙන සිටි බ්‍රිතාන්‍යයන් මෙම වර්ධනය වෙමින් පවතින තත්ත්වය ඒ සඳහා ගමන් කිරීමකැයි උපකල්පනය කොට තිබූ බව 1915 කෝලාහලය මර්දනය කොට ඇති ආකාරයෙන්ම මැනවින් වටහාගත හැකිය. කෙසේ නමුත් මෙම කෝලාහලය සම්බන්ධ සිදුවීම් විමර්ශනය කරන විට පෙනීයන්නේ භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමක් සම්බන්ධ කිසිදු සටහනක් දක්නට නොලැබීමයි. 1848න් පසුව ක්‍රමිකව වර්ධනය වූ බෞද්ධ අධ්‍යාපනික ප්‍රබෝධය සමගින් සංස්කෘතිකමය වශයෙන් බුද්ධාගම ප්‍රමුඛ කොටගත් නව සම්ප්‍රදාය බිහිවෙමින් පැවති අතර එහි ප්‍රධාන බලවේගයක්ව සිටි භික්ෂුව 1915 කෝලාහලයේ දී නිහඬබවක් පළකිරීම කුකුසක් මතු කරවයි. එම කුකුස සම්බන්ධයෙන් දිය හැකි පිළිතුරක් ලෙස භික්ෂූන් කෝලාහලයට සම්බන්ධ යැයි සැක කිරීමට සාක්ෂ්‍ය නොතිබීම පෙන්වා දිය හැකිය. එසේම අනගාරික ධර්මපාලතුමා හැරෙන්නට මුස්ලිම්වරුන්ගේ ව්‍යාප්තිය පිළිබඳව හෝ එම ජනවර්ගය පිළිබඳව විරෝධාකල්ප මතු කිරීමක් හෝ කිසිදු භික්ෂුවක් විසින් සිදු කරන ලද බවට තොරතුරු ද හමු නොවේ.

මෙම වෙනස් වීම් පිළිබඳව කුමාරි ජයවර්ධනගේ මතය වන්නේ ''සිංහල බෞද්ධ ව්‍යාපාරයේ න්‍යායාචාරීහු සිංහල ජනයා ආර්යවරු ය ඔවුහු මේ රටේ සැබෑ හා සත්‍ය නිවැසියෝය. සුළු ජතිකයෝ පරදේශීහුය යන පුරා වෘත්තය අවධාරණය කළහ. මෙහි ප්‍රතිඵලය වූයේ (19 වැනි සියවසේ ඇති වූ ආර්ථික විපර්යාසයන් හේතු කොටගෙන) තම අනන්‍යතාව තහවුරු කරගැනීමට ඒ වනවිටත් පටන්ගෙන සිටි සුළුතර කොටස් තුළ ආගමික හා ජනවාර්ගික හැඟීම් උත්සන්න වීමයි. අවාසනාවට මෙන් ජනවාර්ගිකත්වය හා ආගම ගැන වූ මේ සැලකිලිමත් වීම පසු කලෙක බරපතල ගැටුම් බවට සංවර්ධනය වී දිවයිනේ දේශපාලන හා සමාජ පසුබිම මූලික වශයෙන් වෙනස් කිරීමට හේතු විය''[37] යනුවෙනි. මෙම මතය සම්බන්ධයෙන් යම් ආකාරයකට එකඟ විය හැකි වුවත් දහනව වන සියවසේ

වාර්ගික හා ආගමික අනන්‍යතාව පදනම් කරගනිමින් පැනනගින ප්‍රබෝධය තත්කාලීනව ඇතිවීම අනිවාර්ය වූවක් වුවත් බ්‍රිතාන්‍ය පාලකයන් එකී උත්සන්න වීම ස්වකීය පාලනය පවත්වාගෙන යාමට භාවිත කරන ලද බව පැහැදිලි නොකිරීම අසාධාරණය.

## ආන්තික සටහන්

1. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, සමීපාතීතයේ බෞද්ධාචාර්යයෝ (කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1964), 30.
2. එම, 32.
3. එම, 35.
4. ටිකිරි අභයසිංහ, ශ්‍රීමතී ලෝනා දේවරාජා, ජී. වී. පී. සෝමරත්න, උඩරට රාජධානිය (කොළඹ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්, 1977), 132.
5. මාලනී ඇදගම, "යටත් විජිතවාදයේ ව්‍යාප්තිය සහ ස්වදේශීය ප්‍රතික්‍රියා", ශ්‍රී ලාංකේය ඉතිහාසය-වෙළුම IV (සංස්.) ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග (කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2014), 119.
6. කුමාරි ජයවර්ධන, සොක්කන් ලොක්කන් වූ වගයි (කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, 2006), 280.
7. Michael Robets, Collective Identities, Nationalism & Protest in Modern Srilanka (Colombo: Marga institute,1979), 4th chapter, 2nd table.
8. Ibid, 167.
9. Ali Ameer, " Muslim Participation in the Export Sector if Sri Inka 1800-1915 ", Muslim of Sri Lanka, (ed.) M.A.M. Shukrie (Beruwala, Jamiah Nalema Insti. , 1986,) 242.
10. කුමාරි ජයවර්ධන, සොක්කන් ලොක්කන් වූ වගයි, 279.
11. Michael Robets, Collective Identities, Nationalism & Protest in Modern Srilanka (Colombo: Marga institute,1979), 4th chapter, 2nd table.
12. කුමාරි ජයවර්ධන, සොක්කන් ලොක්කන් වූ වගයි, 282.
13. එම, 283.
14. Kumari Jayawardhana, The Rise of the Labor Movement in Ceylon (Durham: Duke University Press, 1972),42.
15. A. C. Dep, The History of the Ceylon Police (Colomo, The Tims of Ceylon Ltd., 1969), 283.



16. නවරත්න බණ්ඩාර, බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය (කොළඹ: ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්, 2007), 364.
17. සරසවි සඳරැස පුවත්පත, 1905 ජනවාරි 05. SLNA
18. ආමන්ඩ් ද සූසා, 1915 සිංහල මරක්කල කෝලාහලය, (පරි.) යසපාල වනසිංහ (කොළඹ: ඇස්. ගොඩගේ සහ සමාගම, 2009), මෙම කෘතියේ වලහගොඩ හඳුන්වා ඇත්තේ වල්ලහගොඩ ලෙසය.
19. එම, 156-176.
20. බණ්ඩාර, 365.
21. එම, 365 - 366.
22. සූසා, 42.
23. එම, 41.
24. P.I.Ramanathan, Riots & Martial Low in Ceylon (London: Martin's Press,1916), 02-05. සූසා, 45.
25. එම, 46.
26. ආමන්ඩ් ද සූසාගේ කෘතියේ කොළඹ කෝලාහල ආරම්භය මැයි 31 ලෙස දක්වා ඇතත් නවරත්න බණ්ඩාරගේ කෘතියේ දැක්වෙන්නේ මැයි 30 වන දා ලෙසය. සූසා, 48.; බණ්ඩාර, 367.
27. බණ්ඩාර, 367-368.
28. Hansarad, 1916, 17.
29. සූසා, 66.
30. එම, 65.
31. කුමාරි ජයවර්ධන, සොක්කන් ලොක්කන් වූ වගයි, 336.
32. එම, 338.
33. එම,
34. බණ්ඩාර, 370.
35. Souvenier - Diomond Jubilee of the Buddhist Theosophical Sociaty 1880-1940, Ceylon Observer Press, Colombo: 1940, 18, 42.
36. P.V.J. Jayasekara, Social Power & Political Change in Ceylon, 379.
37. බණ්ඩාර, 372.
38. කුමාරි ජයවර්ධන, සොක්කන් ලොක්කන් වූ වගය, 344.